සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** කාලය පැය 01 යි.

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

01. කාන්තා සමිතියේ ලේකම් තුමිය <u>කෙන්ද කන්ද කර කීමට</u> රුසියෙකු බව අම්මා කීවාය.

(1) අනුන් මුලා කිරීමට (2) කඳුකපා සමතලා කිරීමට
(3) කුඩා දෙයක් විශාල කොට කීමට (4) කඳු ගැන කතා කීමට

02. ඉඩම් ආරවුලක් හේතුවෙන් එකපතේ කෑ මිතුරන් ලෙස සිටි ඔවුහු පසු කලක දී විරසක වූහ.

(1) එකට ආහාර ගත් (2) සහෝදරයන් ලෙස සිටි
(3) එකම පිඟානක ආහාර ගත් (4) දැඩි මිතුරුකමෙන් සිටි

03. ඊ බෝවී ආපසු ගමට එමින් සිටි වෙළෙන්දා වටකරගත් හොරු ඔහුගේ <u>ඉන ඉහ අත ගා ගෙන</u> ගියහ.

(1) ඉනෙහි තිබූ මුදල් පැහැර ගෙන (2) ඉන සහ ඔලුව අත ගා
(3) සියලු වටිනා දේ පැහැර ගෙන (4) බඩු පමණක් ගෙන

- සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවරදිව යෙදී ඇති පෙළ තෝරන්න.

04. (1) ආභාෂය, විශ්මය, නිරූපණය (2) ප්‍රස්තාවනාව, පිළියෙල, ප්‍රතිඵල
(3) කොට්ඨාශය, මධ්‍යෂාර, පැලෑටි (4) ඖෂධ, ඓක්‍යය, කෞෂල්‍ය

- අකාරාදි පිළිවෙලට ගළපා ඇති පද පේළිය තෝරන්න.

05. (1) ආරියසිංහ, කරුණාදාස, සෝමාවතී, චන්ද්‍රාපාල
(2) ගුණාසෝම, පද්මසේන, ළමාහේවා, චන්ද්‍රාවතී
(3) කුමාරදාස, චන්ද්‍රසේන, සෝමපාල, හරිස්චන්ද්‍ර
(4) පියසීලි, ඩේවිඩ්, ජිනසේන, කරුණාසේන

06. යංශය, රේඵය, රකාරාංශය, ගයනුකිත්ත පිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ප්‍රශ්න, මාර්ගය, ඖෂධ, අත්‍යවශ්‍යය (2) අත්‍යවශ්‍ය, මාර්ගය, ප්‍රශ්න, ඖෂධ
(3) මාර්ගය, ප්‍රශ්න, අත්‍යවශ්‍ය, ඖෂධ (4) අත්‍යවශ්‍ය, මාර්ගය, ප්‍රශ්න, ඖෂධ



EXAMRESULTS.LK

- මුලින් දී ඇති පදයට සමාන අර්ථයන් නොදෙන පදය තෝරන්න.

07. දිනිඳු - (1) දිවයුරු (2) දිවාකර (3) දිනකර (4) දිළින්දා

08. දේදුනු - (1) සුරසැව් (2) ඉඳුසැව් (3) සුරලිය (4) ඉන්ද්‍රචාප

- එක් එක් වචනවල මුලකුරෙහි ඇදය, දීර්ඝ පාපිල්ල, ඉස්පිල්ල සහ ඇලපිල්ල පිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

09. (1) කැත්ත, කුල්ල, මිට, කාලය (2) වැලි, නූල, ගිරය, කාලය

(3) දෙබල, මුල්ල, දූපත, වැට (4) ගෙදර, රූපය, මීකිරි, මාලය

10. මිනිසාගේ යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කළ විට නිවරදිව දක්වෙන්නේ කෙසේ ද?

(1) මිනි + සාගේ (2) මිනිසා + ගේ (3) මිනිස් + ආගේ (4) මිනිසා + අගේ

- 11 සිට 13 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවරදිව දක්වෙන උත්තරය තෝරන්න.

11. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා යහපත් සේවයට කැප වූ ගුරුපරපුරක් බිහි කිරීමෙහිලා **පුරෝගාමී** විය.

(1) මුල්විය (2) නිරත විය (3) උත්සහවන්ත විය (4) ඉදිරිපත්විය

12. එකණෙහි එක් **මාගමක්** නාලාගිරි දැක මරණභය භීතවැ පලා යන්නීය.

(1) පුතෙක් (2) දරුවෙක් (3) මිනිසෙක් (4) ස්ත්‍රියක්

13. අක්කා විශ්වවිද්‍යාලයට සමත් වීමෙන් ඇය තුළ ඇති වූ **ප්‍රහර්ෂය** මුහුණේ පිළිබිඹුව තිබිණි.

(1) දුක්බදායක තත්ත්වය (2) අධික සන්තෝෂය

(3) බියට පත් වූ බව (4) කලබලයට පත් වූ ස්වභාවය

14. යමක් වර්ණා කිරීම, විස්තර කිරීම, ස්වභාවය දක්වීම සඳහා යෙදෙන පද

(1) කෘදන්ත පදයි (2) තද්ධිත පදයි (3) නාම පදයි (4) විශේෂණ පදයි

15. විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන්නේ කුමක් ද?

(1) අනුමාන - ප්‍රත්‍යක්ෂ (2) අභියස - පිටුපස (3) ප්‍රච්ඡන්න - විවෘත (4) නිපුණ - ප්‍රවීණ

- පහත වාක්‍යයේ ඉරි ඇඳි කොටස් කවර ක්‍රියාපදයකට අයත්දැයි තෝරන්න.

16. ඔහු නාට්‍ය <u>බලා</u> ගෙදර <u>යද්දී</u> වර්ෂාවකට හසුවිය.

(1) විධික්‍රියා - මිශ්‍ර ක්‍රියා (2) පූර්වක්‍රියා - කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

(3) ප්‍රයෝජ්‍ය ක්‍රියා - ප්‍රාර්ථනා ක්‍රියා (4) පූර්ව ක්‍රියා - මිශ්‍ර ක්‍රියා

17. පූර්ව ස්වරලෝප සන්ධියට උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) නියංසාය (2) සුරත (3) නිරවුල් (4) මලසුන

18. දී ඇති අකුරු ගැළපීමෙන් නිර්මාණය වන නිවරදි සම්භාව්‍ය ග්‍රන්ථ නාමය තෝරන්න.

(1) කුදාවසන (2) යපුලිජාන (3) රමාඅතුස (4) ණබුරත්ස

- අංක 19, 20 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

19. එක කරදරයක් පිට තවත් කරදරයක් පැමිණීම.

(1) අලි මදිවට හරක් (2) අනේ කාලේ වනේ වාසේ

(3) අතු කඩා මොර කනව වගේ (4) උඩ පැන්නොත් බිම වැටේ

20. කිසියම් වැරද්දක් වූ විට එය අහිංසක මිනිසුන් මත පැටවීම.

(1) පනින රිලවුන්ට ඉනිමං බැන්දා වගේ

(2) ඇමගිල්ල මාළුවා වගෙයි.

(3) නියර මිටි තැනින් පු වතුර බහින්නේ

(4) පිදුරු ගොඩේ ඉන්න බල්ලා වගේ

- අංක 21 සිට 24 ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

21. ............................................................ රජයේ රක්ෂිතයෙහි ගස් කපති' යි වන නිලධාරීහු සැක කළහ.

(1) සොරු (2) සොරුන් (3) සොරෙක් (4) සොරුන් විසින්

22. තාරකාවෝ රාත්‍රී අහස අලංකාර ............................................................

(1) කරති (2) කරයි (3) කරන්නේය (4) කරන්නීය

23. ගොවියෝ ............................................................ සමඟ ගොයම් කපති.

(1) ගෙවිලියන් (2) ගෙවිලියෝ (3) ගෙවිලියෙක් (4) ගැහැනු

24. නාහිමි ප්‍රධාන දායක මහතා සමඟ පන්සලේ දියුණුව ගැන සාකච්ඡා ............................................................

(1) කළහ (2) කළේය (3) කළ සේක (4) කරනු ලබති

- 25 සිට 28 ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පදය තෝරන්න.

25. මෑතක දී ලිය වී ඇති පොතපත ............................................................ කිරීමෙන් ඒ පිළිබඳව වැඩිපුර කරුණු රැස්කර ගත හැකි විය.

(1) පරිශීලනය (2) පරිණාමය (3) පරිවරණය (4) පරිභව

26. බැද්දේගම යනු ලෙනාඩ් වුල්ෆ් විසින් ලියන ලද "විලේජ් ඉන් ද ජංගල්" යන කෘතියේ ............................................................

(1) පරිවර්තනයකි (2) සංස්කරණයකි (3) අනුකරණයකි (4) පෙළගැස්මකි

27. ශ්‍රී ලංකාව විදේශීය ............................................................ මුදවා ගැනීම සඳහා දිවි නොතකා සටන් වැදුණු නායකයෝ ජන හදවත් තුළ සදාකල්හි ම ජීවත් වෙති.

(1) ගවේෂණයෙන් (2) රාජාඥාවෙන් (3) ආධිපත්‍යයෙන් (4) ග්‍රහචාරයෙන්

28. එම නගරය වූ කලී, සතුරු වුවදුරක දී ............................................................ දෙන බල කොටුවකි.

(1) ශිබාමණිය (2) රක්ෂාවරණය (3) නිර්වෘත්තිය (4) ශිර්ෂාවරණය

29. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසින් නිර්මාණය කරන ලද නාට්‍ය යුගලය වන්නේ,

(1) කැලණි පාලම, කුවේණි (2) එළොව ගිහින් මෙලොව ආව, රත්තරං

(3) මනමේ, නරිබෑණා (4) හුණුවටයේ කථාව, සිංහබාහු

30. හේන් ගොවිතැන ආශ්‍රිත බස් වහරේදී අලියන් වේලාව යනු,

(1) අලි ගමන් කරන වේලාව (2) රාත්‍රී කාලය

(3) අඳුර වැටෙන වේලාව (4) උදෑසන කාලය

31. A - විස්මයාවහ - පුදුමයෙන් තොරව

B - කෝගිනි කඳ - කෝපය නම් ගිනි ජාලාව

C - ඉන්නල - ඉනි + අල

D - කන්සෙට පාරක් - කනට පහරක්

ABCD යෙදුම් යුගල අතරෙන් නිවරදි යුගලය වන්නේ,

(1) A හා B පමණි (2) A හා C පමණි (3) A, C හා D පමණි (4) B,C හා D පමණි

- 32 සිට 36 දක්වා ප්‍රශ්න වල, ව්‍යාකරණකූලව නිවරදි වාක්‍ය තෝරන්න.

32. (1) මිනිසුන් අවංක නොවන්නේ ඇයි (2) අප සුපරි තරු වෙමු
(3) අම්මා නංගිට බත් කවති (4) ගස් සුළඟට සෙලවෙති

33. (1) නුඹලා අනාගත නායකයෝ වූ (2) ඔහු ක්‍රීඩකයෙකු වෙයි
(3) හෙතෙමේ ගමට ගියෝය (4) ගොවියා ගවයන් බඳිනු ලබති

34. (1) පෙදරේරුවෝ ගොඩනැගිල්ල නිමා කරාවි (2) සිසුහු පන්තියට පැමිණ ඇත
(3) තාත්තා මල්ලිට පොත් තෑගි කරති (4) සභාතොමෝ සතුටින් විසිර ගියාය

35. (1) වැද්දෝ විසින් හාවෝ මැරෙති (2) ඔහු දෙවියෙකු වැනි මිනිසෙක් ය.
(3) මෙවර ජය ගන්නේ අපිය (4) අම්මා ද නංගි ද ගමට යන්නිය

36. (1) දක්ෂ ක්‍රීඩකයකු වන ජයන්ත ගායකයෙකු ද වෙයි.
(2) දළදා හිමි මහනුවර වැඩ වෙසෙති
(3) ගෙවල් පේළිය සුළඟට කඩා වැටෙති
(4) විනිසුරුතුමා සැකකරුවන් නිදහස් කළේය

- පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරන්න.

උසස් අධ්‍යාපනය සඳහා එංගලන්තයේ එඩින්බරෝ විශ්ව විද්‍යාලයට ඇතුළු වූ සේනක බිබිලේ මහතා මහාචාර්ය වාන්හෙඩ් මහත්මිය සමඟ එක්ව කළ පර්යේෂණයක් නිසා වෛද්‍ය ක්ෂේත්‍රයේ කීර්තිමත් පුද්ගලයකු බවට පත් විය. ස්ටෙරොයිඩ් ගණයට අයත් විශේෂ හෝමෝන කාණ්ඩයක් පිළිබඳ ව කළ ඒ පර්යේෂණය අගය කරමින් බ්‍රිතාන්‍ය විද්‍යා සඟරා සහ පුවත් පත්වල ලිපි පළ විය. වෛද්‍ය සේනක බිබිලේ ඒ පර්යේෂණයෙහි නිරත වූයේ ආචාර්ය උපාධිය සඳහා අධ්‍යයනයක් වශයෙනි. ඔහුගේ පර්යේෂණ නිබන්ධය සඳහා එඩින්බරෝ විශ්ව විද්‍යාලය විසින් ආචාර්ය හෙවත් පී. එච්. ඩී. උපාධිය පිරිනමන ලදී.

37. සේනක බිබිලේ මහතා එඩින්බරෝ විශ්ව විද්‍යාලයට ඇතුළු වූයේ,
(1) උසස් අධ්‍යාපනය සඳහා ය. (2) වෛද්‍ය පර්යේෂණ සඳහා ය.
(3) කීර්තිමත් පුද්ගලයෙකු වීම සඳහා ය. (4) ඉතිහාසගත වීම සඳහා ය.

38. හෝමෝන කාණ්ඩයක් පිළිබඳ ව කළ පර්යේෂණයක් හේතුවෙන් බිබිලේ මහතා
(1) උපහාසයට ලක් විය (2) පරිහානියට පත්විය
(3) මහාචාර්යවරයකු විය (4) කීර්තියට පත්විය

39. බ්‍රිතාන්‍ය විද්‍යා සඟරා සහ පුවත් පත්වල ලිපි පළ වූයේ,
(1) බිබිලේ මහතා අගය කරමිනි (2) මහාචාර්ය වාන්ගෙඩ් අගය කරමිනි
(3) පර්යේෂණය අගය කරමිනි (4) නිබන්ධය අගය කරමිනි

40. සේනක බිබිලේ මහතාට ආචාර්ය උපාධිය හිමි වූයේ,
(1) එංගලන්තයට පැමිණි නිසා (2) එඩින්බරෝ විශ්ව විද්‍යාලයට ඇතුළු වූ නිසා
(3) වෛද්‍යවරයෙක් වූ නිසා (4) පර්යේෂණ නිබන්ධය නිසා

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය - II** කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

- අංක **(i)** සිට **(x)** තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) ඕෂ්ඨජ අල්පප්‍රාණ අක්ෂර දෙකක් ලියන්න.

(ii) පහත වචනවල අක්ෂර වින්‍යාසය වැරදි ය. එය නිවැරදි කර ලියන්න.

(අ) ප්‍රෂස්ති කාව්‍ය (ආ) අරාබි ශිෂ්ඨාචාරය

(iii) පහත දී ඇති පාඨවල උපමානය හා උපමේය වෙන්කර දක්වන්න.

(අ) නරමුල් ඇඟ ඇට කිඹුලෙකු වැන්නේ

(ආ) සින්ධූපමාන වැව් තලා මතින්

(iv) පහත වාක්‍ය නිවරදි කර ලියන්න

(අ) ඇතමෙකු පාඩම් කරති (ආ) අපි සියල්ලන්ම ශ්‍රී ලාංකිකයෝ වෙමු

(v) පහත වාක්‍යයේ ඇති නිපාත පද දෙකක් උපුටා ලියන්න.

(අ) යළි නුඹ මෙහි නො එති' යි සිතා සිටි නමුත් නුඹ මෙහි පැමිණියෙහි ය.

(vi) පහත වාක්‍යයේ යෙදී ඇති උපසර්ග පද දෙකක් වෙන්කර ලියන්න.

" අනුනායක හිමියෝ දුසිල් මහණුන් සසුනෙන් නෙරපිමට ඉමහත් වෙහෙසක් ගත්හ."

(vii) පහත සඳහන් පද සන්ධි කරන්න.

(අ) වන + ඖෂධ

(ආ) අති + අලංකාර

(viii) පහත සඳහන් වාක්‍ය කර්ම කාරක වාක්‍ය බවට හරවන්න.

(අ) ගුරුවරු ශිෂ්‍යයින් යහමඟ යවති

(ආ) ඔවුහු නිකරුනේ අප වෙහෙසුහ

(ix) පහත දී ඇති වාක්‍ය, සුදුසු, පරිදි විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

අපි ඉතින් ගමේ ගත කරපු ජීවිතේ තමයි තාමත් ගෙවන්නේ බිරිය ඔහුට නිතර කීවාය ඇගේ කන පින්දම ඔහුට වදයක් විය

(x) පහත කමත් භාෂාවේ යෙදෙන පදවල අර්ථය ලියන්න.

(අ) මෝල්කඩ -

(ආ) යාල්ලනවා - (ලකුණු 2 x 10 = 20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන කොටස් වලින් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වනසේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න. (ල. 25)

(අ) වර්තමානය වනවිට සමාජය තුළ සිදුවෙන්නා වූ අකටයුතු කම් බොහෝ ය. සිරිත් විරිත් සාරධර්ම සමාජයෙන් ඉවතට යෑම වේගයෙන් සිදුවෙයි. එම ඉවතට යෑම බොහෝ සමාජ ප්‍රශ්න ඇති කිරීමට හේතු වී ඇති බව පෙනේ. දහම් පාසල් අධ්‍යාපනය දරුවන්ගෙන් ඈත්වීම මේ ව්‍යසනයට ප්‍රබල හේතුවයි. ඒ නිසා අනාගත පරපුර දහම් පාසල් අධ්‍යාපනයට යොමු කිරීම වැඩිහිටියන්ගේ ප්‍රබල වගකීමකි.

(ආ) පසුගිය දස අවුරුදු කාලය තුළ ලෝකයේ සහ ශ්‍රී ලංකාවේ ගංවතුර, නාය යෑම, සහ සුනාමි වැනි භයානක ස්වාභාවික අනතුරු වැඩිවෙමින් පවතින බව පෙනේ. හදිසි අවස්ථාවක ට මුහුණ දෙන ආකාරය හා එයින් ආරක්ෂාවීමේ ක්‍රියා පිළිවෙළ පිළිබඳව අපි සියලු දෙනාම දැනුවත් වීම වැදගත් ය. මෙම කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් "ආපදා කළමණාකරණයේ වැදගත්කම" යන මැයෙන් රචනයක් ලියන්න.

(ඉ) යම් රටක පැවැත්වෙන සංස්කෘතික උත්සව ඒ හා බැඳි චාරිත්‍ර වත් පිළිවෙත් හා ඇදහිලි එම රටේ වසන ජාතින්ගේ අනන්‍යතාව පිළිබිඹු කරන කැඩපතකි. මෙම උත්සව මගින් මිනිස් සිත් සතන් හි පිරි පවතින දුර්ගුණ අවම කර ගැනීමට හක්තිය ලබා දෙයි. එමගින් වාද භේද දුරලා එකිනෙකා අතර අන්‍යෝන්‍ය අවබෝධය හා සුහදත්වය වර්ධනය කර ගැනීමට හැකියාව ලැබේ.

(ඊ) සමස්ත ලෝකයම පරිගණක තාක්ෂණය සමඟ බැඳී පවතී. ඒ නිසා විවිධ කාර්යන් පහසු වී ඇත. එහෙත් පාසල් සිසුන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීමට ද විවිධ ගැටලු සඳහා ද මුහුණ දීමට සිදු වී ඇත. එම ගැටලු අවමකර ගනිමින් පරිගණක තාක්ෂණය යහපතට ම යොදා ගත යුතුය.

(ලකුණු 25)

03 පහත සඳහන් ඡේදය වචන 20 - 25 අතර ප්‍රමාණයකින් සාරාංශ කරන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

කාව්‍ය නිර්මාණය සඳහා කවියෙකු තුළ පැවැතිය යුතු අවශ්‍යතා කිපයක් ගැන ද මෙහි සඳහන් කළ යුතුයි. එයින් එකක් නම් ප්‍රතිභාවයි. ප්‍රතිභාව යනු අපූර්ව වස්තු නිර්මාණයෙහි පවත්නා දක්ෂතාවයි. එනම් තමන් තෝරා ගත් වස්තු, පුද්ගලයන් හෝ පරිසර ආදිය අපූර්ව ආකාරයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාවයි. දෙවන අවශ්‍යතාව ලෙස සැලකෙන්නේ බහුශ්‍රැත භාවය හෙවත් බොහෝ ඇසූ පිරූ තැන් ඇති බවයි. ප්‍රතිභාවයෙන් ඌණ වුවත් බහුශ්‍රැත භාවය හා අත්දැකීම් වලින් යුක්ත වේ නම් තම කාව්‍ය නිර්මාණය කළ හැකි බව මේ අනුව හෙළිවේ. තෙවන අවස්ථාව වනුයේ කාව්‍ය කරණයේ නිතර නිතර යෙදීමයි. මෙය සතතාභ්‍යාසය යනුවෙන් හැඳින්වේ. මෙසේ නිතර නිතර කවි ලිවීම මගින් නිර්මාණකරණයට යොමු විය හැකි වේ.

(ලකුණු 10)

04 පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ජනප්‍රවාදයට අනුව සිංහරාජය ගුප්ත අභිරහස් සැඟ වුණු සුවිසල් වනාන්තරයකි. එනමුදු වර්තමානයේ මේ ආකල්පය වෙනස් වෙමින් සැබෑ තතු පසක් වෙමින් පවතී. මේ අනුව සිංහරාජය ප්‍රශස්ත හා තිරසාර ඵල ලබාගත හැකි පිවි විශේෂ අතින් පොහොසත් තිවර්තන වර්ෂා වනාන්නතරයකට ආදර්ශයකි. තෙත් කලාපීය පහත් බිම් හා අතර මැදි බිම්වලඇති අද්විතීය විවිධත්වය සමඟ වන ජීවීන් රැක ගැනීමට අවස්ථාව සලසා දෙන තරම් සුවිශාලවන එකම වනාන්තරය සිංහ රාජ යයි. සිංහරාජ රක්ෂිතය හා ඒ අවට ඇති මොරපිටිය, රූනකන්ද, පනාගල දෙල්ගොඩ යන වනරක්ෂිතයන් ඇතුළුව හෙක්ටයාර් 47370 ක භූමි ප්‍රමාණයක් පුරා පැතිරෙයි.

(i) සිංහරාජ පිළිබඳව ජනප්‍රවාදයන්ට අනුව පැවැති ආකල්පය කුමක් ද?

(ii) එය කුමන ගණයට අයත් වනාන්තරයක් ද?

(iii) සිංහරාජ වනයේ පමණක් පවතින විශේෂ ලක්ෂණ දෙකක් නම් කරන්න.

(iv) සිංහරාජයට අයත් වෙනත් වන රක්ෂිතයන් දෙකක් නම් කරන්න.

(v) මෙම වනාන්තරය පොහොසත් වී ඇත්තේ කුමකින් ද?

(ලකුණු 2 x 5 = 10)

05 පහත දැක්වෙන්නේ පුවත්පත් වාර්තා කරුවෙකුගෙන් උපුටා ගත් දළ සටහනකි. එය උපයෝගි කරගෙන පුවත්පත් වාර්තාවක් වචන 100කින් පමණ ලියන්න.

සිංහල නාට්‍ය පිටපත් තරගාවලියේ සම්මාන ප්‍රදානය

දිනය :- 2108 - 09 - 10

වේලාව:- පෙ.ව. 9.30 සිට ප.ව. 2.00 දක්වා

සහභාගිත්වය :- ජයග්‍රාහකයින්, තරගකරුවන්, හා ආරාධිත අමුත්තන්

ප්‍රධානත්වය :- ගරු සංස්කෘතික කටයුතු පර්ෂදය

පැවැත්වූ ස්ථානය:- පණ්ඩුලගම පූජා ශාලාවේදී

සංවිධානය :- සංකෘතික නිලධාරි, පණ්ඩුලගම, අනුරාධපුර (ල. 15)

නැතහොත්

කුණු කසළ දැමීමෙන් සිදුවන පරිසරහානි වලක්වාලීම සඳහා නිසි ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා ඔබ පළාතේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට ලියන ලිපිය සකස් කරන්න. (ල. 15)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය - III** කාලය පැය 02 යි.

නම/ විභාග අංකය:

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

---

(01) (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) මුනි සිරිපා සිඹිමින්නේ යන පාඩම උපුටාගත් පද්‍ය නිර්මාණයේ නම ලියන්න.
(ආ) ඇස්. මහින්ද හිමි කවි ලියූ ප්‍රධාන තේමාවක් ලියන්න.

(ii) (අ) විලේජ් ඉන් ද ජංගල් (Village in the Jungle) නව කතාව රචනා කළේ කවුරුන්ද?
(ආ) " සුදු ගෝනා" නව කතාවේ පරිවර්තකයා කවුරුන් ද?

(iii) "පුත එයිත් මට කියා ද ගන්නේ ? ඇර ගන්ව"
(අ) මේ ප්‍රකාශය කළේ කවුරුන් විසින් ද?
(ආ) මෙහි 'පුත' යනුවෙන් ඇමතුම් ලබන්නේ කවුරුන් ද?

(iv) (අ) ලෙන අතහැර යාම පාඩම කුමන නාට්‍යයේ කොටසක් ද?
(ආ) එදිරිවීර සරත්චන්ද්‍ර මහතා ලියූ ස්වයං ලිඛිත චරිතාපදානයේ නම ලියන්න.

(v) (අ) "දනමුතු කමට කී කවි" සඳහා යෙදෙන අනෙක් නම ලියන්න.
(ආ) කෙළි සෙල්ලම් ආශ්‍රිත ජන කවිවලට උදාහරණ ලෙස ජන ක්‍රීඩා 2 ක් ලියන්න.

(vi) දිමුතු යසස් වන් කුසුම සරාගේ
නුමුතු සුවඳ මල් පැළඳ සරාගේ
(අ) මෙම කවි පද ඇතුළත් කාව්‍ය කෘතිය කුමක් ද?
(ආ) අංකිත පදයේ අර්ථය ලියන්න.

(vii) (අ) ජාතක කතා ඇසුරින් ලියවුණ ගී කාව්‍යයක නම ලියන්න.
(ආ) උම්මග්ග ජාතකය ලිවීමේ අරමුණ කුමක් ද?

(viii) (අ) එච්.එම්. කුඩලිගම කවියා සංස්කරණය කළ කවි සඟරාව කුමක් ද?
(ආ) මෙම කවියාගේ කාව්‍ය ග්‍රන්ථ දෙකක නම් ලියන්න.

(ix) (අ) වැත්තෑවේ හිමියන්ගේ ගුරුවරයා කවුරුන් ද?
(ආ) සලාවත ජයපාල මැතිඳුන් සේවය කළේ කුමන රජතුමා හට ද?

(x) (අ) තාගෝර් කවියා පවත්වාගෙන ගිය සරසවියේ නම කුමක් ද?
(ආ) එදිරිවීර සරත්චන්ද්‍ර මහතා ජාත්‍යන්තර වශයෙන් ලැබූ සම්මානයක නම ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

02 පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) 'නොදනිති හසරක් නුපුරුදු එතිදෙන
පැමිණෙන පිරිපත වළකනු කෙලෙස ද
දිරි ඇති මුත් පුත නරයෙකි ගතමුදු
ලොව දුක නැත අදවන තුරු කිසි කළ'

(අ) මෙහි අංකිත පදවල අර්ථය ලියන්න.
(ආ) පද්‍යව මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(ii) "රජ්ජුරුවෝ වනාහි රාජ මානයෙන් ද ඉසුරු මදයෙන් ද මත් වැ දණ්ඩකින් පහරන ලද සර්ප රාජයකු සේ කෝපයෙන් දිලිහී"
(අ) මෙහි අංකිත පදවල අර්ථය ලියන්න.
(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii) ගුත්තිල මහ සිපි
සක් දෙව් බසින් සැතපී
මින් දිනමැයි දැපී
බමර තත පළමුවෙන් සිඳපී
(අ) ඉහත කවියේ අංකිත පදවල අර්ථය ලියන්න.
(ආ) සමස්ත කවියේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(iv) තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
පුද නොකළොත් උඹෙන් පුතේ
මොලොවට කිසි පලක් නැතේ
(අ) මෙම කවියේ අංකිත පද වල අර්ථය ලියන්න.
(ආ) සමස්ත කවියේ ම අර්ථය ලියන්න.

(v) අපල ගෙන දෙන අසුබ නිමිති ඇත්තේ යයි ද අවතාර අඩිකෝඩවලින් පිරුණේ යයි ද ප්‍රසිද්ධව ගිය මේ ගෙයි වාසයට ඒමට තරම් සැහැසි වූ කිසිවෙක් ගමේ නොවූහ.
(අ) මෙම ගද්‍ය කොටසේ අංකිත පදවල අර්ථය ලියන්න.
(ආ) මෙහි විස්තර වන අවස්ථාව කෙටියෙන් ලියන්න.
(ල. 4 × 5= 20)

03. (i) පරාර්ථකාමී බවේ ආනිසංසයත්
(ii) ස්වාර්ථකාමී බවේ විපාකත්
උම්මග්ග ජාතක කතාවෙන් විස්තර වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න.
නැතහොත්
(i) සරල බස් වහරක් භාවිතයත්
(ii) කාව්‍යමය වියත් වහර භාවිතයත්
යන කරුණු අපූර්ව අවස්ථා නිරූපණයකට මග පාදා ඇති අයුරු එක් කරුණකට උදාහරණ 2 බැගින් දෙමින් පැහැදිලි කරන්න. (ල. 15 )

04. (i) දේශාභිමානී හැඟීම් ජනිත කිරීම
(ii) චරිත සංවර්ධන උපදේශ සැපයීම
යන කරුණු වලින් මුනි සිරිපා සිඹිමින්නේ කාව්‍ය නිර්මාණය සාර්ථක නැළවිලි කාව්‍යයෙක් වී ඇති ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න. (ල. 15)
(i) දාරක සෙනේහයෙන් පිරුණු පියෙකු හා
(ii) ස්වාධීනත්වය පතන තරුණ පුතෙකු සිංහබාහු නාට්‍යයෙන් අපට හමුවේ. එක් කරුණකට උදාහරණ 02 බැගින් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න. (ල. 15 )

05. නොපසුබට උත්සාහයෙන් ජීවිතයට මුහුණ දෙන කාන්තා චරිතයක් ලෙස පුංචි මැණිකාගේ චරිතය අගය කළ හැකිය. උදාහරණ 03 ක් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න. (ල. 10)

06. අජීවී පරිසර වස්තූන්ට සජීවී බවක් ආරෝපණය කරමින් අපූර්ව කාව්‍ය සංකල්පනා නිමැවීමට කුඩලිගම කවියා සමත් වී ඇති අයුරු උදාහරණ 03 ක් දෙමින් පැහැදිලි කරන්න. (ල. 10)

07. ජීවිත අත්දැකීම් ඇසුරින් සරලව උපදෙස් සැපයීම උපදේශ කවියාගේ අරමුණ වී ඇති අයුරු උදාහරණ 03 ක් දෙමින් පැහැදිලි කරන්න. (ල. 10)

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව — තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය — සිංහල භාෂාව හා සාහිත්‍යය

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (3) | 11 - (1) | 21 - (2) | 31 - (4) |
| 2 - (4) | 12 - (4) | 22 - (1) | 32 - (1) |
| 3 - (3) | 13 - (2) | 23 - (1) | 33 - (1) |
| 4 - (2) | 14 - (4) | 24 - (2) | 34 - (4) |
| 5 - (3) | 15 - (4) | 25 - (1) | 35 - (2) |
| 6 - (4) | 16 - (2) | 26 - (1) | 36 - (4) |
| 7 - (4) | 17 - (2) | 27 - (3) | 37 - (1) |
| 8 - (3) | 18 - (4) | 28 - (2) | 38 - (4) |
| 9 - (2) | 19 - (1) | 29 - (2) | 39 - (3) |
| 10 - (3) | 20 - (3) | 30 - (3) | 40 - (4) |

## II කොටස (නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

01 (i) ප, බ

(ii) (අ) ප්‍රශස්ති (ආ) ශිෂ්ටාචාරය

(iii)

| | උපමාන | උපමේය |
|---|---|---|
| (අ) | කිඹුලෙකු | නරමුල් ඇග ඇට |
| (ආ) | සාගර | වැව් |

(iv) (අ) ඇතැමෙක් පාඩම් කරති. (ආ) අපි සියල්ලෝම ශ්‍රී ලාංකිකයෝ වෙමු.

(v) (අ) යළි, නො, නමුත්, ය

(vi) (අ) අනුනායක, දුසිල්, ඉමහත්

(vii) (අ) වනෞෂධ

(ආ) අත්‍යලංකාර

(viii) (අ) ගුරුවරුන් විසින් ශිෂ්‍යයෝ යහමඟ යැවෙති/ යවනු ලබති

(ආ) ඔවුන් විසින් නිකරුනේ අපි වෙහෙස වනු ලැබූහ / ලැබුවෝය

(ix) (අ) " අපි ඉතින් ගමේ ගත කරපු පිවිතේ තමයි තාමත් ගෙවන්නේ," බිරිය ඔහුට නිතර කීවාය. ඇගේ කනපින්ද ම ඔහුට වදයක් විය.

(x) (අ) මෝල්කඩ - කමත එන පාර

යාල්ලනවා - කමතේ වී මනිනවා

02 රචනය සඳහා

| | | |
|---|---|---|
| 1. | සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව | ලකුණු 08 |
| 2. | සංවිධානය, නිර්මාණාත්මක භාවය | ලකුණු 12 |
| 3. | ශිල්පීය දක්ෂතා ඡේද බෙදා ලිවීම | ලකුණු 05 |
| | මුළු ලකුණු | 25 යි. |

03 සාරාංශය

1. අන්තර්ගතය ලකුණු 06
2. වචන ගණන ලකුණු 02
3. ශිල්පීය දක්ෂතා ලකුණු 02

★ කාව්‍ය නිර්මාණය සඳහා අවශ්‍ය ප්‍රතිභාව අඩු වුවත් බහු ශ්‍රැත භාවය හා අත්දැකීම් වලින් යුක්ත වේ නම් සතතාභ්‍යාසය මගින් කාව්‍ය නිර්මාණයට යොමු වීමෙන් කවියෙකු විය හැකිය.

04 (i) ගුප්ත අභිරහස් සැඟවුණ සුවිසල් වනාන්තරයකි.

(ii) නිවර්ථන වර්ෂා වනාන්තරයකි.

(iii)
- තෙත්කලාපීය පහත් බිම් හා අතරමැදි බිම්වල ඇති විවිධත්වය
- වනජීවී රැකගැනීමට තරම් හැකියාව ඇති විශාල වනාන්තරයක් වීම

(iv) මොරපිටිය, රූනගල කන්ද, පනාගල, දෙල්ගොඩ

(v) ප්‍රශස්ත හා තිරසාර ඵල ලබා ගත හැකි ජීවී විශේෂ අතින්

05 පුවත් පත් වාර්තාව

| | | |
|---|---|---|
| ආකෘතිය | - | ලකුණු 03 |
| අන්තර්ගතය | - | ලකුණු 07 |
| ශිල්පීය දක්ෂතා | - | ලකුණු 05 |
| මුළු ලකුණු | | 15 |

ලිපිය ලකුණු 15

| | | | |
|---|---|---|---|
| ආකෘතිය | - | ලකුණු | 02 |
| අන්තර්ගතය | - | ලකුණු | 07 |
| ශිල්පීය දක්ෂතා | - | ලකුණු | 05 |
| මුළු | | ලකුණු | 15 |

## III කොටස

01 (i) (අ) ජාතික තොවිල්ල හෙවත් දරු නැළවිල්ල
(ආ) ළමයින් උදෙසා ලියූ කවි / දේශානුරාගය හා ජාතිකාභිමාන කවි / බුද්ධාභිවන්දනා කවි

(ii) (අ) ලෙනඩ් වුල්ෆ් (ආ) ඒ. පී. ගුණරත්න

(iii) (අ) වෛදේහ රජතුමා (ආ) මහෞෂධ පඬිතුමා

(iv) (අ) සිංහබාහු (ආ) පිං ඇති සරසවි වරමක් දෙන්නේ

(v) (අ) උපදෙස් දීම සඳහා කී කවි (ආ) ලී කෙළි / ඔළිඳ කෙළි / කළගෙඩි නැටුම් / ඔන්චිලි වාරම්

(vi) (අ) ගුත්තිල කාව්‍ය (ආ) සිරස අග

(vii) (අ) මුවදෙව්දාවත /සසදාවත / කව් සිළුමිණ (ආ) මහෞෂධ පඬිතුමාගේ බුද්ධි මහිමය කියාපෑම

(viii) (අ) සුවඳ (ආ) ඈ / කුණාටුව / එකෝමත් එක රටක / සංවාදය

(ix) (අ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි (ආ) vi වෙනි පරාක්‍රමබාහු රජතුමා

(x) (අ) ශාන්ති නිකේතන (ආ) කුමාරන් අශාන් / රැමොන් මැග්සෙසය / ස්වර්ණ රජත
(ලකුණු 2 x 10 = 20)

02 (i) (අ) • මාවතක් / මගතොටත් • උවදුරු / උපද්‍රව
(ආ) නුහුරු එම තිදෙනා මග තොටක් නොදනිති පැමිණෙන උපද්‍රව වලක්වා ගන්නේ කෙසේ ද? ධෛර්ය ඇතත් පුතා ශරීරය සියුමැලි මිනිසෙකි. අද වනතුරු කිසි දින ලෝකය දැක නොමැත.

(ii) (අ) • පහර දෙන ලද • වෙව්ලා
(ආ) මහෞෂධ පණ්ඩිතයන්ගේ යොධයන් දහස උතුරු පසල් දනව්වට ගොස් සුරාපාන උත්සවය පැවැත් විය නොහැකි සේ කෝලහාල කර ආපසු ගිය බව ඇසූ චූලනී රජු කෝප වූ අවස්ථාව.

(iii) (අ) සිපි - ශිල්පියා සැතපී - සතුටුව
(ආ) ගුත්තිල නම් වූ මහා ශිල්පියා ශක්‍ර දේවේන්ද්‍රයාගේ වචනයෙන් සතුටුව මෙම තරගයෙන් දිනම්' යි යන එඩිතර බවින් යුතුව පළමුව බමර තත කඩා දැම්මේය.

(iv) (අ) සමය - ආගම
පලක් - ප්‍රයෝජනයක් / ප්‍රතිඵලයක්
(ආ) තමා ලබාගත් ජීවිතයේ කොටසක් රට හා ජාතිය වෙනුවෙන් කැප නොකළහොත් පුතේ ඔබගෙන් මේ ලෝකයට ප්‍රයෝජනයක් නොමැත.

(v) (අ) අඩිහෝඩවලින් - කලබල / විකාර / කෝලම්
සැහැසි - දරුණු
(ආ) ආරච්චි මායියා දරුවන් සමඟ ගම අතහැර ගිය පසු ආරච්චි නිවස, ඉඩම හා අවට පරිසරය පාලුවට ගිය බව විස්තර වන අවස්ථාව (ලකුණු 4 x 5 = 20)

03 (i) ★ මා බඳු පණ්ඩිත කෙනෙකුන් ජීවත් වැ හින්ද දීම මෙතෙක් රජ දරුවන් මිය යෑම යුක්ත නොවන්නේය.
★ රාජාදීහු භයින් දිලිහිලා හිඳිති, මා උන් අස්වසා ලුව මැනැව.
(ආදී අවස්ථා ඇසුරින් පිළිතුරු ගොඩ නැගීම)

(ii) • උපායන් ව්‍යාර්ථ වීම උදා: රජවරුන් මැරීමට සිතීම , ධර්මයුද්ධය පැරැදීම ආදී උදාහරණ ගෙන පිළිතුර ගොඩ නැගීම

නැතහොත්

(i) • ගුත්තිල ඇදුරු සඳ........
• නොදනම තමා බල .........
• දෙදෙනම ඉඳ දෙපිට ............
• අප බෝ සතුන් මීස ............. ආදී උදාහරණ

(ii) ★ පිසසන් නොව බිඟු දල් ඉදි කොපුල............
★ මන්මත් කරවනදන මුළු දෙරණ............
★ වර වෙන නද අසමින් සිත සතොසිනි..........
(ආදී ගැළපෙන උදාහරණ)

04. (i) ★ මුණි සිරිපා සිසිමින්නේ .........................
★ ජාතික රණ දෙරණ මතේ.........................
★ ජාතිය රන් විමනක් වේ...........................
★ තමන් ලැබූ දිවි පෙවෙතේ.....................

(ii) ★ කරදර දහසක් හමු වී ........................
★ තමන් ලැබූ දිවි පෙවෙතේ..............
★ ඉටු කොට කළ යුතු යුතුකම් .................
★ සිනිඳු මොළොක් බව.....................
★ කාටත් හිමි පොදු දේ නම්.................

නැතහොත්

(i) • මෙසේ හටගත් බිය සැක සිතින් (පොතේ ඉන්නිසය)
• අප නැතිව පියා ඔබ
ළය පැළී මැරී යයි (සුප්පාදේවි ප්‍රකාශය)
• නොදනිති හසරක් ...........

(ii) සිංහබාහු කරන ප්‍රකාශ ඇසුරින් සුදුසු උද්ධෘත තෝරා ගෙන තිබිය යුතුය.

05 ★ අනුන්ගේ හේන්වල වැඩ කිරීම
★ ආහාර සෙවීමට වනයට යාම
★ බබුන්ගේ පැමිණීම අපේක්ෂාවෙන් කටයුතු කිරීම
★ බබුන් සොයා තංගල්ලට යාම හා බැඳුන අවස්ථාව (ලකුණු 10)

06 • කඳු බෑවුමක ...............
• සැඟවෙමි එබෙමි ..............
• හිරිමල් හිනා රැලි ................. ආදී සුදුසු උදාහරණ (ලකුණු 10)

07 • වඩාත් ගැළපෙන කවි තෝරාගෙන තිබිය යුතුය. (ලකුණු 10)